කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2021 දෙසැම්බර් මස 12 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2021 දෙසැම්බර් මස 12 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**දිවයින හරහා ඊසානදිග මෝසම් තත්ත්වය ක්‍රමයෙන් ස්ථාපිත වෙමින් පවතී. එබැවින් උතුරු, උතුරු-මැද, නැගෙනහිර සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් වැසි තත්ත්වයේ තරමක වැඩිවීමක් බලාපොරොත්තුවේ.**

නැගෙනහිර, උතුරු, උතුරු-මැද සහ ඌව පළාත්වලත් හම්බන්තොට සහ මාතලේ දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි ඇතිවන අතර මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මිලිමීටර් **50** ක පමණ තරමක තද වැසිද ඇතිවිය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණ සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් බලාපොරොත්තු විය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 12 DECEMBER 2021**
**Issued at 05.30 a.m. on 12 December 2021**

**The Northeast monsoon condition is gradually establishing over the island. Hence, the showery condition in Northern, North-central, Eastern and Uva provinces and Hambantota district is expected to enhance to some extent.**

Showers will occur at times in the Eastern, Northern, North-central and Uva provinces and in Hambantota and Matale districts. Fairly heavy rainfall about **50 mm** can be expected at some places in these areas.

Showers or thundershowers will occur at a few places in Western and Sabaragamuwa provinces and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts during the evening or night.

Misty conditions can be expected at some places in Western, Sabaragamuwa, Central, Southern and Uva provinces during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2021 දෙසැම්බර් මස 12 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය, මඩකලපුව පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත ඇතිවේ. සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රි කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ.

ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය සහ මන්නාරම හරහා පුත්තලම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (40-45) පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

ත්‍රිකුණාමලය සිට කන්කසන්තුරය සහ මන්නාරම හරහා පුත්තලම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ සාමාන්‍ය ස්වභාවයේ පවතී.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 12 December 2021**

**Condition of Rain:**

Showers or thundershowers will occur at several places in the sea areas extending from Kankasanturai to Hambantota via Trincomalee, Batticaloa and Potuvil. Showers or thundershowers will occur at a few places in the other sea areas during the evening or night.

**Winds:**

Winds will be North-easterly and the wind speed will be **(20-30) kmph** in the sea areas around the island.

Wind speed can increase up to **(40-45) kmph** at times in the sea areas extending from Trincomalee to Puttalam via Kankasanturai and Mannar and in the sea areas extending from Matara to Potuvil via Hambanthota.

**State of Sea:**

The sea areas extending from Trincomalee to Puttalam via Kankasanturai and Mannar and in the sea areas extending from Matara to Potuvil via Hambanthota can be fairly rough at times. The other sea areas around the island will be slight.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි